**ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව - 2017**

**-----------------------------------------------------------**

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ 2017දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනතේ 18 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2018 මැයි 30 දින සභාවේ සභාපති වෙත නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

**--------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**2.1 මතය ව්‍යාවනය**

**----------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

ප්‍රමිතයේ 48 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවද ඊට අනුකූල නොවන ලෙස පර්යේෂණ ආයතන සඳහා ගෙවිය යුතු රු.144,452 ක ශේෂ සහ ලැබිය යුතු රු.46,217 ක ශේෂ එකිනෙකට හිලව් කර 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.98,235 ක ශුද්ධ ශේෂයක් දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්රමිත 02**

සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ සඳහා ලැබී තිබූ භාණ්ඩාගාර ප්‍රදාන රු.10,801,000 ක් හා පර්යේෂණ වියදම් රු.11,277,588 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි 22(ඇ) ඡේදය ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවත් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ සිට උපකරණ සඳහා ලද පරිත්‍යාග ක්‍රමක්ෂය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පරිත්‍යාගවල වටිනාකම රු.114,697 කින් වැඩියෙන් සහ සමුච්චිත අතිරික්තය සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ප්‍රවර්තන වර්ෂයේ දී ගොඩනැගිල්ලට තීන්ත ආලේප කිරීම හා අළුත්වැඩියා කිරීම සඳහා වැය කරන ලද රු.449,480 ක අයභාර වියදම ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලිවල පිරිවැය රු.449,480 කින් හා වර්ෂයට අදාල ක්ෂය රු.2,809 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර වත්කම් ඉවත්කිරීමේ අලාභය රු.157,949 ක් වුවද විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ එය රු.161,854 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 2.2.3. විගණනය සඳහා සාක්ෂි නොවීම්

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල පර්යේෂණ සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ ප්‍රාග්ධන ප්‍රදාන රු.5,856,588 ක ඍණ ශේෂයක් ලෙස දක්වා තිබුණු අතර එහි නිවැරදිභාවය විගණනයේදී සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

-------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව, ආරම්භක හා අවසාන ආපදා ණය ශේෂ, ආපදා ණය ලේඛනයේ ශේෂ (Loan Interest & Installment Schedule) සමග සැසඳීමේදී පිළිවෙලින් රු.49,992 ක හා රු.99,981 ක වෙනස්කම් නිරීක්ෂණය වූ අතර ඊට හේතු පැහැදිලි කර නොතිබුණි.

**2.3. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

----------------------------------

2017 දෙසැම්බර් 31 දිනට නොපියවූ පර්යේෂණ අග්‍රිම රු.650,131 ක් හා නොපියවූ අත්තිකාරම් සෘණ ශේෂය රු.21,564 ක් 2015 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතියද එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

------------------------------------------------------------------------

2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවත් 2014 වර්ෂයේදී ලබා දී තිබූ රු.31,963 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,432,734 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,434,932 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,997,802 ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පරිපාලන වියදම් රු.6,262,761 කින් වැඩි වී තිබුණද රජයේ ප්‍රදාන රු.10,250,000 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී , 2013 හා 2014 වර්ෂවල සභාවේ ශුද්ධ අලාභයක් ඇති වී තිබුණද ඉන් පසු වර්ෂ වලදී ශුද්ධ ලාභයක් ඇතිවී තිබූ අතර 2015 වර්ෂයේදී රු.3,594,269 ක් වූ එය 2016 වර්ෂයේ දී රු.2,434,932 ක් දක්වා අඩු වී තිබුණි. එහෙත්, සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය රු.5,437,734 ක් දක්වා නැවතත් වර්ධනය වී තිබුණි. එසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී ආයතනයේ දායකත්වය 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු. 24,507,650 ක සිට රු.34,399,045 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**4.1 කාර්යසාධනය**

----------------

**4.1.1 ක්‍රියාකාරීත්වය සමාලෝචනය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනත අනුව, සභාවේ ප්‍රධාන කාර්යයන් ඉටුකර ගැනීම සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට අනුව,

පර්යේෂණ වැඩසටහන් 13 ක් සඳහා රු.10,801,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එහෙත් එම වැඩසටහන් අතුරින් කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රමුඛතා, කෘෂිකාර්මික දත්ත තොරතුරු සොයාගැනීම සහ ජර්නල් සකස් කිරීම, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පර්යේෂණ ආයතන අතර සම්බන්ධතාවය යන පර්යේෂණ වැඩසටහන්වල භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 37, සියයට 21 ක් හා සියයට 8 ක් ලෙස අවම මට්ටමක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුල INFORM – 2017 වාර්ෂික පුහුණු වැඩමුළුව යටතේ බාහිර ආයතන 20 ක් නිරීක්ෂණය කර, පර්යේෂණ සඳහා ආයතනය මඟින් හඳුන්වා දී තිබූ පරිගණක මෘදුකාංගයේ පවතින ගැටළු හා දුර්වලතා නිරාකරණය කිරීමට සැලසුම් කර තිබුණද, ඒ අනුව කටයුතු කිරීමකින් තොරව එම ආයතනවල නිලධාරීන් සභාව වෙත කැඳවා රැස්වීමක් මගින් දැනුවත් කිරීම පමණක් සිදුකර තිබුණි.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---------------------------

අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව, වසරකට රු.මිලියන 300 බැගින් වැයකර ඉදිරි වසර 05 ක කාලයක් සඳහා සභාව විසින් ජාතික කෘෂි පර්යේෂකයන්ට විදේශීය පශ්චාත් උපාධි ලබාදීමට සැලසුම් කර තිබුණි. මේ සඳහා සුදුසු විශ්වවිද්‍යාල තෝරා ගැනීමට අමාත්‍යාංශ ලේකම්, සභාවේ සභාපති හා ලේකම් ඇතුළු නිලධාරීන් 06 දෙනෙකු රු.4,341,358 ක වියදමින් විදේශ සංචාරයක නිරත වී තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

2012 වර්ෂයේදී සභාව විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘතියක මූල්‍ය චෝදනා සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයක් ක්‍රියාත්මක වෙමින් පැවති මහාචාර්යවරුන් දෙදෙනෙකු වෙත එම තත්ත්වය සලකා බැලීමකින් තොරව බාහිර සමාලෝචනය කරන ආයතන දෙකක සමාලෝචන කමිටුවල තනතුරු සඳහා සභාව විසින් පත්කර එකතුව රු.95,000 ක දීමනා ගෙවා තිබුණි.

## 4.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------

2016 දෙසැම්බර් 31 දින මිලදී ගෙන තිබූ රු.116,150 ක් වටිනා ටයර් 04 ක් විගණිත දිනය වූ 2017 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.5 කාර්යමණ්ඩල පරිපාලනය

----------------------------

සුදුසුකම්ලත් නිලධාරියෙකු ගණකාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමකින් තොරව ජ්‍යෙෂ්ඨ විද්‍යාඥවරියක් එම තනතුරේ වැඩ ආවරණය කිරීමට පත්කර තිබුණි.

# 5. තිරසාර සංවර්ධනය

---------------------

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

--------------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආරක්ෂක කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා එක්සත් ජාතීන්ගේ වසර ''2030 න්‍යාය පත්‍රය'' ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතුකලයුතු බව දක්වා තිබුණි. ඒ අනුව අදාල අමාත්‍යාංශය විසින් සාගින්න පිටුදැකීමේ සහ දේශගුණික විපර්යාස හා එහි බලපෑම අවම කරගැනීම යන ඉලක්කයන් සභාව වෙත පවරා තිබුණු අතර සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා තොරතුරු රැස්කරගැනීමේ කාර්යයන් පැවරීම සිදු කර තිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------------

### 6.1. ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.4.3 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන ආචාරධර්මවලට අනුකූල නොවන ලෙස විදේශ පුහුණුවක් සඳහා සහභාගී වූ නිලධාරීන් දෙදෙනෙකු ඊට අදාල රු.171,600 ක් වටිනා ගුවන් ප්‍රවේශ පත්‍ර මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයන් ලෙස කටයුතු කර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1(බී) ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවක අවම වශයෙන් එක් සාමාජිකයෙකුවත් අදාල ප්‍රසම්පාදනය පිළිබඳ විශේෂඥවරයකු වියයුතු බව දක්වා ඇති නමුත් සභාව මගින් සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබූ රු.2,513,120 ක පරිගණක හා උපාංග මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාල තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා විශේෂඥවරයකු සහභාගී කර ගෙන නොතිබුණි.

### 6.2 අයවැය ලේඛනමය පාලනය

-------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත අයිතම 39 ක වියදම් තත්‍ය වියදම් සමග සැසඳීමේදී සියයට 19 සිට සියයට 100 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 07. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගිණුම්කරණ අඩුපාඩු පැවතීම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | අවශ්‍යතාවය සැලකිල්ලට නොගෙන මිලදී ගැනීම් සිදුකිරීම. |
| (ඇ) | ප්‍රසම්පාදන කළමනාකරණය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවීම් පැවතීම |
| (ඈ) | අයවැය පාලනය | වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ක්‍රියාකාරී සැලැස්මට අනුව අයවැය ලේඛන සකස්කර නොතිබීම. |